# සමස්ත ලංකා ගුරු උපදේශක වෘත්තීය සංගමය

**ලි.ප. අංකය 6591**

**අංක. 08, මැදගොඩවත්ත, නිවිතිගල**

**Web: aimttu.org | Email: info@aimttu.org**


**"අප පසුකර යාමට හැකි විශිෂ්ට පුරවැසියන් නිර්මාණය කරමු."**

2020.10.12

සියලුම කලාප අධ්‍යක්ෂ

මහත්ම / මහත්මීන් වෙත,

මහත්මයාණෙනි / මහත්මියනි,

**ගුරු උපදේශකවරුන් සේවයට අන්තර්ග්‍රහණය කිරීම හා ඔවුන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳව දන්වා සිටීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක 2182/36 හා 2020.07.01 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 21/2020 හා 2020.08.20 දින දරණ චක්‍රලේඛය මගින් ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපනය කොට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

02. ඉහත ගැසට් නිවේදනයට හා චක්‍රලේඛයට අනුකූලව ඔබ අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශකවරුන් ලෙස කටයුතු කරන ගුරු මහත්ම මහත්මීන් ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමු.

03. එසේම ඉහත ගැසට් නිවේදනයට හා චක්‍රලේඛයට අනුව සේවයට අන්තර්ග්‍රහණය වන කිසිඳු ගුරු උපදේශකවරයෙකුගේ වැටුප අඩුවීමක්, විලම්භනය වීමක් හෝ කප්පාදු වීමක් සිදු නොවන අතර, ඔවුන් දැනට ලබාගන්නා වැටුපට, වැටුප් පියවරක් ඉදිරියෙන් තබා සේවයට අන්තර්ග්‍රහණය කරන ලෙසත්, විශ්‍රාම ගැන්වීමේ දී ඔවුන් එදිනට ලබන වැටුප පදනම් කරගෙන විශ්‍රාම ගැන්වීමට කටයුතු කරන ලෙසත්, මේ පිළිබඳව ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමු.

04. සේවයට අන්තර්ග්‍රහණය කිරීම් පිළිබඳව ඔබට කිසියම් ගැටලුවක් ව්‍යුත්පන්න වුවහොත් සෘජුවම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හෝ ජාතික වැටුප් හා සංඛ්‍යා කොමිෂන් සභාවෙන් උපදෙස් ලබාගන්නා ලෙස ද කාරුණිකව දන්වා සිටිමු.

05. අවශ්‍ය උපදෙස් ලබා ගැනීමෙන් තොරව සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ හා වැටුප් සකස් කිරීමේ දී අප සංගමයේ සාමාජිකයකු හට අසාධාරණයක් සිදුවුවහොත්, ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමට පසුබට නොවන බව ද කාරුණිකව දන්වා සිටිමු.

ස්තුතියි.

මෙයට,

සංගමයේ අණ පරිදි,

.......................................

එස්.ජී.එම්. සමරකෝන්

(ගරු ලේකම්)

එස්.ජී.එම්.සමරකෝන්
ගරු ලේකම්
සමස්ත ලංකා ගුරු උපදේශක
වෘත්තීය සංගමය
08,මැදගොඩවත්ත,නිවිතිගල.